12768

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 1 | |
| 2(i) | |
| 2(ii) | |
| 3(i) | |
| 3(ii) | |
| එකතුව | |
| උත්තරපත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

# රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2014 (2015)

## (03) භාෂාව හා රචනය

පැ එකයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පැනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

විභාග අංකය : ...........................

**1.** පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන **200 – 250** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(i) රටක මහජනතාව රාජ්‍ය සේවකයාගෙන් බලාපොරොත්තු වන්නේ අවංක හා අපක්ෂපාතී සේවයකි.

(ii) ශාරීරික ව්‍යායාමය මෙන් ම ආත්ම සංයමය ද උදෙසා ක්‍රීඩාවෙන් ලැබෙන්නේ නොමඳ පිටුවහලකි.

(iii) අහිංසක මනුෂ්‍ය ජීවිත අමු අමුවේ ඝාතනයට ලක් කෙරෙන මැදපෙරදිග ත්‍රස්තවාදී අරගල

(iv) ස්වාභාවික ආපදා තර්ජන අවම කරගත හැකි උපාය මාර්ග

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka

**2.** පහත දැක්වෙන පාඨය කියවා අංක (අ) සිට (ඕ) තෙක් දී ඇති එක් එක් ප්‍රකාශයට වඩාත් ගැළපෙන වරණය තෝරා ඊට අදාළ අංකය ඒ ඒ ප්‍රකාශය ඉදිරියේ වරහන තුළ ඇති තිත් ඉර මත ලියන්න.

(i) වාචික ශබ්ද සමවබෝධය සඳහා නාට්‍යමය කියවීම භාෂාව ඉගැන්වීමේ දී උපයෝගී කර ගත හැකි සරලතම ක්‍රම අතුරින් එකකි. මේ ක්‍රමය සඳහා නාට්‍ය ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් ඇති සුදුසු නාට්‍යය හැරුණු විට ඉගැන්වීමේ වෙනත් උපකරණ අවශ්‍ය නොවන හෙයින්, එය සාමාන්‍ය පන්ති කාමරයක් තුළ පවා කළ හැකි ය. භාෂාව ඉගැන්වීම යන්නෙන් මා අදහස් කරන්නේ, භාෂාව කෙරෙහි සම්පූර්ණ ප්‍රතිචාර දැක්වීමේ පුරුද්ද ළමයාගේ සිත තුළ මුල් බැස්සවීම මිස වචනවල පදගතාර්ථයට පමණක් සීමා වූ ලඝු සමවබෝධය ඉගැන්වීම නොවේ. අදහස් ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් වශයෙන් භාෂාවේ ඇති ශක්තිය ළමයාට අවබෝධ කර ගැනීමට ද මෙය උපකාරී වේ. මින් අදහස් කෙරෙන්නේ සම්පූර්ණ අර්ථය ප්‍රකාශ කිරීම සඳහා නිවැරදි උච්චාරණය, අවධාරණය, රිද්මය, වේගය සහ විරාමය උපයෝගී කර ගැනීම යි.

නාට්‍යමය කියවීමත් සමග ස්වරයේ ඇති ගීතාත්මක ගුණය අර්ථයේ ඇති ඨානයන් ප්‍රකාශ කිරීම සඳහා ඒ ගුණය සිතාමතා ම සකස්කොට ගැනීම ද සංවේදනය වන පරිදි කන පුහුණු කළ යුතු ය. මේ අරමුණ සඳහා මෙන් ම, චරිත නිරූපණය කිරීම සහ මනෝභාවයන් පහළ කිරීම සඳහා ද ශබ්ද නිවැරදි ලෙස යොදා ගැනීම කෙරෙහි අපගේ පාසල්වල දී, විශේෂයෙන් ම සිංහල භාෂාව උගන්වන විට ලැබෙන්නේ අල්ප අවධානයකි යනු මගේ විශ්වාසය යි. ශබ්ද නගා කියවීමේ ක්‍රමයක් යොදා ගෙන ඇතත් ඒ ක්‍රමය ද අර්ථය කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදක්වයි. මේ ක්‍රමය ප්‍රසිද්ධ කථා පැවැත්වීමේ දී බහුලව අනුගමනය කරන එක්තරා ශෛලියකින් ලබා ගත් බව පෙනේ.

අර්ථය ප්‍රකාශ කිරීමේ දී, කථා කරන වචනවලට අතිරේක වශයෙන් උපයෝගී කර ගත හැකි උචිත සාත්විකාභිනය සහ අංගහාරයන් පවා ඇතුළත් වන පරිදි නාට්‍යාකාර කියවීම පුළුල් කළ හැකි ය. අපගේ නිවෙස්වල දී ළමයින්ගේ සම්පූර්ණ පෞරුෂය පරිදි ඔවුන් තුළ බොහෝ විට රෝපණය කොට ඇති නිෂේධනයන් මුලිනුපුටා දැමීමට මේ ප්‍රකාශන ක්‍රම තුන පිළිබඳ පුහුණුවක් ලබා දීම බොහෝ සෙයින් උපකාරී වනු ඇත. නාට්‍යයේ ඇති කාල්පනික අවස්ථා සැබෑ ලෝකයේ දී ඇතිවන අවස්ථා බවට පත් කිරීමට ළමයින් අනුක්‍රමයෙන් ඉගෙන ගනිත් ම තම අදහස් ප්‍රකාශ කිරීමේ වඩා ඵලදායී මාර්ග තමන් වෙත ඇති බවත්, එමගින් තමන්ගේ පෞරුෂය වඩා හොඳින් ප්‍රකාශ කිරීමෙන් සමාජය කෙරෙහි වැඩියෙන් බලපෑ හැකි බවත් ඔවුන්ට දැනගන්නට ලැබේ.

(අ) නාට්‍යයේ කාල්පනික අවස්ථා සැබෑ ලෝකයේ දී ඇති වන අවස්ථා බවට පත් කිරීමට ළමයින් දැන ගත යුතු වන්නේ,
- (1) පෞරුෂය වඩා හොඳින් ප්‍රකාශ කිරීම යි.
- (2) සමාජය කෙරෙහි වැඩියෙන් බලපෑම් කළ හැකි බව තේරුම් ගැනීම යි.
- (3) වඩාත් ඵලදායී ලෙස තම අදහස් ප්‍රකාශ කිරීමේ මාර්ග තමන් සතුව ඇති බව අවබෝධ කර ගැනීම යි.
- (4) නාට්‍යාකාර කියවීම පුළුල් කිරීම යි. (.........)

(ආ) නිවෙස් ඇතුළත දී ළමයින් තුළ නිෂේධනයන් රෝපණයකොට ඇත්තේ,
- (1) ළමයින් නොමග යන හෙයිනි.
- (2) ළමයින්ගේ චරිත හැඩ ගැස්වීම සඳහා ය.
- (3) සංකීර්ණ මනෝභාවයන් ළමයින් තුළ ඇති නිසා ය.
- (4) පෞරුෂය වඩා හොඳින් ප්‍රකාශ කිරීම සඳහා ය. (.........)

(ඉ) අර්ථ ප්‍රකාශනයේ දී වඩා වැදගත් වන්නේ,
- (1) භාෂණයේ පවත්නා වචන යි.
- (2) සාත්විකාභිනය යි.
- (3) වචනවලට අංගහාරයන් ඇතුළත් කිරීම යි.
- (4) ප්‍රකාශන ක්‍රම තුනක් ගැන පුහුණුව ලබා දීම යි. (.........)

(ඊ) භාෂාව ඉගැන්වීම ආශ්‍රයෙන් මේ ලේඛකයාගේ අවධානය යොමු වන මූලික භාෂාංගය/භාෂාංග වනුයේ,
- (1) නාට්‍යමය කියවීම තුළින් භාෂාව ඉගැන්වීම යි.
- (2) විරාමය නිවැරදිව භාවිත කිරීම යි.
- (3) ශබ්දෝච්චාරණය හා අර්ථ නිරූපණය යි.
- (4) මනෝභාවයන් පහළ කිරීම යි. (.........)

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

12768

(උ) ප්‍රසිද්ධ කථා පැවැත්වීමේ දී අනුගමනය කෙරෙන එක්තරා ශෛලියකින් ලබා ගෙන ඇත්තේ,
(1) ශබ්ද නගා කියවීමේ විරාගත ක්‍රමය යි.
(2) අර්ථය කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම යි.
(3) ශබ්දයට මුල් තැනක් දීමේ ක්‍රමය යි.
(4) කියවීමේ පුරුද්ද යි. (.........)

(ඌ) පාසල්වල සිංහල ඉගැන්වීමේ දී අල්ප අවධානයක් යොමු වන්නේ,
(1) ස්වරයේ පවත්නා ගීතාත්මක ගුණය සංවේදනය කිරීම කෙරෙහි ය.
(2) චරිත නිරූපණය කෙරෙහි ය.
(3) කරුණු තුනක් කෙරෙහි ය.
(4) ශබ්ද නිවැරදි ලෙස යොදා ගැනීම කෙරෙහි ය. (.........)

(එ) අර්ථයේ පවත්නා ථානයන් ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ,
(1) කන පුහුණු කිරීම යි.
(2) ස්වරයේ ගීතාත්මක ගුණය සිතාමතා ම සකස්කොට ගැනීම යි.
(3) අර්ථ සංවේදනය කිරීම යි.
(4) නාට්‍යමය කියවීම යි. (.........)

(ඒ) භාෂාව ඉගැන්වීමේ සරලතම ක්‍රමයක් වන්නේ,
(1) වාචික ශබ්ද නාට්‍යමය වශයෙන් කියවීම යි.
(2) නාට්‍ය රඟ දැක්වීම යි.
(3) නාට්‍ය ග්‍රන්ථවලින් කොටස් උපුටා ගැනීම යි.
(4) උපකරණ ආශ්‍රයෙන් නාට්‍ය ඉගැන්වීම යි. (.........)

(ඔ) තම අදහස් ප්‍රකාශ කිරීමේ වඩා ඵලදායී මාර්ග තමන් වෙත පැවතීමත් තමන්ගේ පෞරුෂය වඩා හොඳින් ප්‍රකාශ කිරීමත් අතර පවත්නේ,
(1) ප්‍රතිෂේධාත්මක සම්බන්ධයකි.
(2) සමීපස්ථ සම්බන්ධයකි.
(3) වක්‍ර සම්බන්ධයකි.
(4) හේතුඵල සම්බන්ධයකි. (.........)

(ඕ) නාට්‍යයේ කල්පිත අවස්ථා සැබෑ ලෝකයේ දී ඇති වන අවස්ථා බවට පත් කිරීමට ළමයින් උගත යුතු වන්නේ,
(1) පෞරුෂය වඩා හොඳින් ප්‍රකාශ කිරීමට ය.
(2) සමාජය කෙරෙහි වැඩියෙන් බලපෑම් කළ හැකි බව තේරුම් ගැනීමට ය.
(3) තම අදහස් ප්‍රකාශ කිරීමේ වඩාත් ඵලදායී මාර්ග තමන් සතුව පවත්නා බව අවබෝධ කර ගැනීමට ය.
(4) නාටකාකාර කියවීම පුළුල් කිරීමට ය. (.........)

(ii) පහත දැක්වෙන පාඨය කියවා ඊට යටින් ඉදිරිපත් කර ඇති නිගමන සඳහා දී ඇති "ඔව්" හෝ "නැත" යන ප්‍රකාශ අතුරින් අදාළ නිගමනය නිවැරදි නම් "ඔව්" යන්න ද වැරදි නම් "නැත" යන්න ද පමණක් ඉතිරි කර අතිරේක ප්‍රකාශය තනි ඉරකින් කපා දමන්න.

ආර්ථික වර්ධන වේගය තිරසාර ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධන පදනම බිහි කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය සැලකිය යුතු ලෙස නවීකරණයකට ලක් විය යුතු බව පැහැදිලි ව හඳුනා ගෙන ඇත. අධ්‍යාපනයේ නිසි ප්‍රතිලාභ ලැබෙනුයේ, අධ්‍යාපන සේවා ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවන්ට ගැළපුණහොත් පමණි. එම නිසා, අධ්‍යාපන ක්‍රමය විභාග මූලික කරගත් විෂය කරුණු මත පදනම් වූ විෂය මාලාවන්ගෙන් පරිබාහිර ව ශිෂ්‍යයන්ට ජීවිතයට අවශ්‍ය කුසලතා සහ ස්වාධීන ව සිතීමේ හැකියාව ලබා දෙන ආකාරයෙන් නිපුණතා මත පදනම් වූ විෂය මාලාවක් බවට වෙනස් කළ යුතු ව තිබේ. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිදු කරන ප්‍රතිසංස්කරණ මගින්, ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ උපාධිධාරීන්ගේ කුසලතා අතර පවතින නොගැළපීම අඩු කළ යුතු අතර, එය තරුණ කොටස් අතර සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අඩු කිරීමට හේතු වනු ඇත. රජය, උසස් අධ්‍යාපනය සඳහා කරනු ලබන ආයෝජන ප්‍රමාණය ඉහළ ගිය ද, ශ්‍රී ලංකාවට දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස නැගී සිටීමට නම්, පෞද්ගලික අංශය සමග ඒකාබද්ධව ආයෝජන ධෛර්යවත් කිරීම මගින් අධ්‍යාපන අංශය වැඩි දියුණු කළ යුතු ව ඇත. අන්තර්ජාල පහසුකම් ඔස්සේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තරයට ඉදිරිපත් කිරීම, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධ ව ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩල හුවමාරු කිරීමේ වැඩසටහන්, පශ්චාත් උපාධි පාඨමාලා විදේශීය සිසුන් සඳහා විවෘත කිරීම, මෑතක දී උසස් අධ්‍යාපන අධිකාරීන් විසින් අනුගමනය කළ ප්‍රශස්ත ක්‍රියා මාර්ග වේ.

[ 5 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

(අ) විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කෙරෙන ප්‍රතිසංස්කරණ හා ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ උපාධිධාරීන්ගේ කුසලතාවන්හි නොගැළපීම අඩු කිරීම අතර පවත්නේ ප්‍රතිෂේධාත්මක සම්බන්ධයකි. (ඔව් / නැත)

(ආ) විදේශ ශිෂ්‍යයන් සඳහා පමණක් පශ්චාත් උපාධි පාඨමාලා විවෘත කළ යුතු බව මේ ලේඛකයාගේ අදහස යි. (ඔව් / නැත)

(ඉ) උසස් අධ්‍යාපන අධිකාරීන් මෑත දී අනුගමනය කළ ප්‍රශස්ත ක්‍රියාමාර්ග තුනක් මෙහි දැක්වේ. (ඔව් / නැත)

(ඊ) පෞද්ගලික අංශය සමග ඒකාබද්ධ නොවන්නේ නම් දැනුම් කේන්ද්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවට නැගී සිටිය නොහැකි ය. (ඔව් / නැත)

(උ) සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අතර අර්ථ වශයෙන් අසමානතාවක් නොපෙනේ. (ඔව් / නැත)

(ඌ) අන්තර්ජාල පහසුකම් නොමැති වූයේ නම් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තරයට ඉදිරිපත් කිරීම කිසිසේත් කළ නොහැකි ව තිබිණ. (ඔව් / නැත)

(එ) ශිෂ්‍යයන් උදෙසා විභාග පැවැත්වීම නිරර්ථක ක්‍රියාවක් බව මේ පාඨයෙන් හෙළි වේ. (ඔව් / නැත)

(ඒ) අදාළ පාඨමාලාව නිපුණතා පාදක කොට ගෙන ඇත්නම් ජීවිතයට අවශ්‍ය කුසලතා හා ස්වාධීන ව සිතීමේ හැකියාව ශිෂ්‍යයන්ට ලබා දිය හැකි ය. (ඔව් / නැත)

(ඔ) පෞද්ගලික අංශයේ ආයෝජන ධෛර්යවත් කිරීම හා අධ්‍යාපන අංශය දියුණු කිරීම අතර පවත්නේ හේතුඵල සම්බන්ධයකි. (ඔව් / නැත)

(ඕ) උසස් අධ්‍යාපනය උදෙසා සියලු ආයෝජන රජය මගින් පමණක් කෙරෙන බව මේ ලේඛකයාගේ අදහස යි. (ඔව් / නැත)

**3.** (i) පහත දැක්වෙන එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත යෙදුම සඳහා වඩාත් ගැළපෙන කෙටි යෙදුම තෝරා එහි අංකය වරහන තුළ ඇති තිත් ඉර මත ලියන්න.

(අ) මගේ මිත්‍රයා නිතර ම **තමා ගැන මහ ඉහළින් කථා කරන** කෙනෙකි.
(1) ආත්මාර්ථකාමිත්වය (2) ආත්මාභිමානය
(3) අත්තුක්කංසනය (4) ආත්මාභිලාෂය (.........)

(ආ) **වචනවල ප්‍රභවය** පිළිබඳ විමසා බැලීම භාෂා විද්වතුන්ගේ කාර්යයකි.
(1) වාග්විද්‍යාව (2) නිරුක්ති
(3) ව්‍යාකරණ (4) ආරම්භය (.........)

(ඉ) නීතියේ ස්වාධිපත්‍යය **කිසිසේත් කඩා බිඳ දැමිය නොහැකි යැයි** සැලකේ.
(1) අනුල්ලංඝනීය (2) අනුත්තරණීය
(3) අනභිභවනීය (4) අනතික්‍රමණීය (.........)

(ඊ) සුනාමිය වූ කලී කිසිදු **බලාපොරොත්තුවක් නොමැති ව හදිසියේ ඇති වූ** ව්‍යසනයකි.
(1) අනාරාධිත ව (2) ආකස්මික ව
(3) අනපේක්ෂිත ව (4) අස්වාභාවික ව (.........)

(උ) ආරක්ෂක නිලධාරියා මහා මාර්ගයෙහි ධාවනය වූ කාරයක් නැවැත්වූයේ **කිසිදු අදාළ හේතුවක් නොමැතිව යි.**
(1) නිෂ්කාරණයේ (2) අසාධාරණයේ
(3) අයුක්තිසහගත ව (4) අත්තනෝමතික ව (.........)

(ඌ) තමා තුළ **නැති ගුණදහම් ඇති සේ අන්‍යයන්ට හඟවා ජීවත් වන** පුද්ගලයෝ සමාජයේ විරල නොවෙත්.
(1) බොරුකාර (2) නිකෘෂ්ට
(3) නිර්ව්‍යාජ (4) කුහක (.........)

(එ) **උචිතානුචිත දේ තෝරා ගැනීමේ බුද්ධියක්** කවියෙකු තුළ තිබිය යුතු බව පෙරදිග ඇතැම් විචාරකයෝ පැවසූහ.
(1) ප්‍රතිභාව (2) ඖචිත්‍යය
(3) බාහුශ්‍රැත්‍යය (4) ව්‍යුත්පත්තිය (.........)



Department of Examinations, Sri Lanka

(ඒ) විදේශ ශිෂ්‍යත්වයක් හිමි කර ගැනීම නිසා මගේ මිත්‍රයා තුළ පහළ වූයේ **ප්‍රමාණ කළ නොහැකි** සතුටකි.

(1) අසාමාන්‍ය (2) අපරිමිත
(3) සාතිශය (4) සීමාන්තික (.........)

(ඔ) **සියලු කල්හි නොපසුබස්නා** ධෛර්යයෙන් පොත් ලිවීම නිසා මගේ මයිලණුවෝ මෙවර සාහිත්‍ය ත්‍යාගයක් හිමි කර ගත්හ.

(1) අප්‍රතිහත (2) අසමසම
(3) උත්කෘෂ්ට (4) අපරිහානීය (.........)

(ඕ) තම සතුරන් **සම්පූර්ණයෙන් ම විනාශ කර දැමීම** ඇතැම් කෲර පාලකයන්ගේ අභිප්‍රාය විය.

(1) මූලෝත්පාටනය (2) ප්‍රතිබාහනය
(3) විධ්වංසනය (4) දේහත්‍යාගය (.........)

(ii) පහත එක් එක් ප්‍රශ්නයේ වාක්‍ය, අක්ෂර වින්‍යාස හා වාක්‍ය දෝෂවලින් තොර ව යෝග්‍ය පරිදි ගළපා තනි වාක්‍යයක් ලෙස ලියන්න.

(අ) මම ගම්බද ශිෂ්‍යයෙක්මි. විශ්ව විද්‍යාලයේ ඉගෙන ගනිමි. මගේ විෂය ආර්ථික විද්‍යාවයි.

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

(ආ) අප සත්‍යය ගරු කළ යුතු ය. නැතිනම් අන්‍යයන්ගේ අවිශ්වාසයට පාත්‍ර වේ. අපකීර්තියට ද භාජනය වේ.

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

(ඉ) ඔහු දක්ෂ වෛද්‍යවරයෙකි. එංගලන්තයේ වෛද්‍ය ආයතනයකින් උපාධි ලබා ඇත. ශ්‍රී ලංකාවේ රජයේ රෝහලක සේවය කරයි.

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

(ඊ) අපි භාෂා ශබ්ද උච්චාරණය කරමු. එසේ කරන්නේ ප්‍රශ්වාස කරන වායුධාරාව උපයෝගී කොට ගෙන යි. මේ වායු ධාරාව පෙනහලුවල සිට ගලා එයි.

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

(උ) නාට්‍යයේ නළුනිළියෝ හොඳින් රඟපෑහ. ඔවුහු ප්‍රේක්ෂකයන්ගේ ප්‍රශංසාවට පාත්‍ර වූහ. තෑගිබෝග ද ලබා ගත්හ.

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka